තිළිණපතට පාවහන් දෙන්න ඔබත් ලියාපදිංචි වන්න.

අධ්‍යාපනයට ඇති සම අවස්ථා තහවුරු කරමින් 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය ලැබීමට සිසුන් දිරි ගැන්වීමේ අරමුණින් "2027 වර්ෂය සඳහා තෝරාගත් පාසල් සිසුන්, පිරිවෙන්වල ගිහි පැවිදි සිසුන් හා සීලමාතාවන් සඳහා පාවහන් යුගලයක් ලබා ගැනීම සඳහා තිළිණපත් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම" අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මෙවරත් කටයුතු කරනු ලබයි.

මේ යටතේ දිවයින පුරා සිසුන් 250 ට අඩු පාසල්වල සිසුන්, සිසුන් 500ට අඩු වතු පාසල්, විශේෂ අවශ්‍යතා සහිත පාසල් සහ පිරිවෙන්වල ඉගෙනුම් ලබන ගිහි පැවිදි සිසුන් හා සීලමාතාවන් සඳහා පාසල් පාවහන් යුගලයක් ලබාදීම සිදු කරනු ලබයි.

මෙම නිර්ණායක යටතේ තෝරා ගනු ලබන බස්නාහිර,දකුණ, සබරගමුව, නැගෙනහිර හා වයඹ යන පළාත් 05 හි පාසල් වෙනුවෙන් වෙනම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි දේශීය පාවහන් නිෂ්පාදකයින් අදාළ පාසල වෙත පැමිණ වෙළඳපළේ පවතින ගුණාත්මක තත්ත්වයේ පාවහන් සිසුන් වෙත ලබාදීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම යටතේ සිසුන් වෙත ලබා දෙනු ලබන තිළිණපත් සඳහා පාසල වෙත පැමිණෙන දේශීය පාවහන් නිෂ්පාදකයන් හැර වෙනත් වෙළඳ මහතුන් වෙතින් පාවහන් ලබා ගැනීමට හැකියාවක් නොමැත.

මධ්‍යම,උතුර,උතුරු මැද හා ඌව යන පළාත් 04 ට රු. 3,000.00 ක වටිනාකමකින් යුත් තිළිණපත් නිකුත් කරනු ලබන අතර, එමගින් ලියාපදිංචි වෙළඳ මහතුන් වෙතින් පාවහන් මිලදී ගැනීමට හැකිවනු ඇත.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි දේශීය පාවහන් නිෂ්පාදකයින් විසින් පාසලට ගොස් පාවහන් ලබාදීම ක්‍රියාත්මක වන බස්නාහිර,දකුණ, සබරගමුව, නැගෙනහිර හා වයඹ යන පළාත් 05 හි පාසල්වල සිසුන්ගේ තිළිණපත්වලට අදාළව පාවහන් ලබාදෙන දේශීය පාවහන් නිෂ්පාදකයින්, ඔබගේ ජංගම දුරකතනය ඔස්සේ Play Store වෙත පිවිස Thilinapath Android යෙදවුම බාගතකර එමගින් රුපියල් 2,000.00ක් ගෙවීම තුලින් ලියාපදිංචිය තහවුරු කරගත යුතුය. මේ යටතේ ලියාපදිංචි විය හැක්කේ අදාළ පාවහන් නිෂ්පාදන ආයතන විසින් හදුනා ගන්නා ලදුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන නියෝජිතයින්ට පමණි.

මධ්‍යම,උතුර,උතුරු මැද හා ඌව යන පළාත්වල පාවහන් මිලදී ගන්නා සිසුන් වෙත පාවහන් අලෙවි කිරීම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කර, ඔබගේ ජංගම දුරකතනය ඔස්සේ Play Store වෙත පිවිස Thilinapath Android යෙදවුම බාගතකර, එමගින් රුපියල් 2,000.00ක් ගෙවීම තුලින් ලියාපදිංචිය තහවුරු කර පාසල් පාවහන් අලෙවි කිරීමට ඔබටත් අවස්ථාව ඇත.

ලියාපදිංචිය සඳහා අවශ්‍ය තොරතුරු...

- ව්‍යාපාරය ලියාපදිංචි සහතිකය.
- ලියාපදිංචි ව්‍යාපාරය නමින් හෝ ව්‍යාපාර හිමිකරුගේ නමින් විවෘත කරන ලද බැංකු ගිණුමේ තොරතුරු
- මෙම යෙදවුම භාවිතා කිරීම සඳහා යොදා ගන්නා දුරකතන අංකය
- මෙම යෙදවුම භාවිතය සඳහා අවශ්‍ය සියලු උපදෙස් හා විස්තර මෘදුකාංගයේ උපකාරක සේවාව වෙත පිවිසීමෙන් ලබාගත හැක.
- ඔබගේ ජංගම දුරකතනය ඔස්සේ play store වෙත පිවිස Thilinapath Android යෙදවුම බාගතකර එමගින් රුපියල් 2,000.00ක් ගෙවීම තුලින් ලියාපදිංචිය තහවුරු කරගත හැක.
- ඉහත උපදෙස් පරිදි මෘදුකාංගය ඔස්සේ ලියාපදිංචි වන වෙළඳ මහතුන් මෙම අමාත්‍යාංශය මඟින් අනුමත කළ පසු, එම යෙදවුම තුලින් පමණක් තිළිණපත්වල සඳහන් QR කේතය පරිලෝකනය (scan) කිරීම හරහා තිළිණපත් සඳහා පාවහන් අලෙවි කිරීමට පහසුකම් සැලසෙනු ඇත.
- ඒ අනුව මෙම ක්‍රමවේදය ඔස්සේ ලියාපදිංචි වන සෑම වෙළඳමහතෙකුට ම පාවහන් තිළිණපත්වල මුද්‍රිත QR කේතය පරිලෝකනය (scan) කිරීම සඳහා සුහුරු ජංගම දුරකතනයක් තිබීම අනිවාර්ය වේ.
- වෙළඳ සැල් හිමියා විසින් පාවහන් මිලදී ගන්නන් විසින් ලබාදෙන තිළිණපතේ වලංගුභාවය තහවුරු කරගැනීම අනිවාර්ය වේ.
- ඔබ විසින් ලබාදෙනු ලබන පාවහන්වලට අදාළ තිළිණපත්වල වටිනාකම ඔබගේ බැංකු ගිණුමට සති දෙකකට වරක් සෘජුවම ප්‍රේෂණය කරනු ලැබේ.
- පරිලෝකනය නොකරන ලද තිළිණපත් සඳහා කිසිදු අයුරකින් ගෙවීම් සිදු කරනු නොලැබේ.
- 2026.11.03 වන දින සිට දේශීය පාවහන් නිෂ්පාදකයින්ට හා වෙළඳ මහතුන්ට ලියාපදිංචි විය හැකිය.
- තිළිණපතෙහි වලංගු කාලය 2026.11.10 දින සිට 2026.12.20 දක්වා වන අතර, වලංගු කාලය දීර්ඝ කිරීමක් සිදු කරන්නේ නම් පසුව දැනුම්දෙනු ලැබේ.

2026-11-03 දින සිට ලියාපදිංචිය ආරම්භ කෙරේ.



paly store වෙත පිවිස Thilinapath Android යෙදවුම බාගත කර ගත හැකිය.

විමසන්න 0112785573

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education